



## පුංචි නංගියේ

රෝසමලක් මෙන් ඔබ අප අතරම පිපුණා
පුංචි දෙපාවලින් නැගිට දුවපැන නැටුවා
පුංචි රෝසමලේ නුඹත් සුළඟට වැනුණා
බලා සිටින කොයිකාටත් සතුටක් දැනුණා

නොසිතූ ලෙස මල මිලානවී ගොස් තිබුණා
අසනීපව පුංචි නංගි අප ළඟ සිටියා
ඉරයි හඳයි වගෙ මව්පියෝ නුඹළඟ රැඳුණා
ඒ එළියෙන් පිබිදුණු නුඹ යළි පණ ගැනුණා

ඉරයි හඳයි වගේ දෙමාපියන් දෙන්නගේ
අනාගතේ එළිය කළා නුඹගෙ ජීවිතේ
නොසිතූ ලෙස පුංචිමලක් නටුවෙන් වැටුණේ
ගියේ පුංචි නංගි අපව තනිකර දෙරණේ

ඔබේ සුවඳ ගේතුළ හැමතැනම දැන් ඇතේ
අතීත නුඹෙ මතක සුවඳ රැඳී ඇත නගේ
කඳුල අපට හිමිකර අප අතැර නුඹ ගියේ
නිවන නමැති මල්වත්තට යන්ට දෝ නගේ

♦ පී. වත්සලා ආරියදාස
යශෝධරා බාලිකා විදුහල, කොළඹ

## වීදි කලාකරුවා

පවනේ මුසුව යන වස්දඬු නාදයට
ඔහු එක්කරයි ගී පදවැල් තාලයට
විඩාබර සිතට දෙන ඔසුවක් ලෙසට
සවන් සැනසේවි මේ ගී තාලයට

දුප්පත්කමට වස්දඬුවක් රැගෙන යන
යාචකයෙක්ද නෑ ඔහු මගතොට යනෙන
ලැබෙන සොච්චමෙන් තම දිවි ගැටගහන
වීදි කලාකරුවෙකි ඔහු සදා තන

♦ පවිත්‍රා සාරංගි වෙරළුපිටිය
මධ්‍ය මහා විද්‍යාලය, පිළියන්දල

## පෝ දා පන්සල් ගමන

සඳරැස් වැටිලා ලොව බබලන වා
ඒ සඳ රැස් මෙන් මල් බැබලෙන වා
තරුකැට වටකර සඳ හිනැහෙන වා
සිල් සුවඳින් පන්සල් බිම පිරි ලා
බෝ මළුවේ ඉඳ දහම් අසන් නේ
හිතේ සතුට මුත් නිමක් නොවන් නේ
තෙරුවන් වැඳලා පින්කර ගන් නේ
පව් නොකරන්නට පොරොන්දු වන්නේ

♦ සඳමාලි වර්ණකුලසූරිය
මහින්ද මහ විදුහල
මඩහපොල මැල්සිරිපුර

## BRITISH LIBRARY බ්‍රිතාන්‍ය පුස්කාලය

The British Library in St Pancras, London NW1, has 13 million books which occupy about 200 miles of shelving. Every year new books take up another two miles. The new library building was completed in 1997 at a cost of £511 million and is the largest public building to be constructed in the UK this century.

බටහිර ලන්ඩනයේ සෙන්ට් පැන්ක්‍රාස් හි පිහිටුවා ඇති මහා බ්‍රිතාන්‍යයේ ප්‍රධාන පුස්කාලය තුළ මිලියන 13 ක් පොත්පත් හා සහරා ගබඩා කර ඇත. එම පොත් එක පෙළකට තැබුවහොත් දිග ප්‍රමාණය සැතපුම් 200 කට වඩා දික්වන්නේ ය. හැම වසරකම අළුත් පොත් එකතුවන විට එම දිග තවත් සැතපුම් 2 කින් වැඩිවේ. 1997 දී නිමවා සම්පූර්ණ කරන ලද මෙම නව පුස්තකාල ගොඩනැගිල්ලට පවුම් මිලියන 511 ක් වැයවූ අතර එය මෙම සිය වසේ එක්සත් රාජධානියේ ගොඩනගන ලද විශාලතම ගොඩනැගිල්ල වශයෙන් සලකනු ලබයි.

♦ *Auntie Ramani* (රමණී නැන්දා)

## ඇස්. මහින්ද හිමි



තිෂිනම්ගල් මෙහි නැවතී
බුදුදහමට ඇල්ම ඇතිව
එස්. මහින්ද යන නාමෙන්
මහණවුණා සසුන් කෙතෙහි

සිහල රටේ සිහල දනන්
අවදි කළේ කවි දැහැනින්
නිදහසෙ වටිනා පැත්තට
තල්ලු කළා දනෝ පෙරට

ටිබෙට් සමිඳු එස්. මහින්ද
කඩා දමා සිහල නින්ද
අවදි කළා රටේ සැවොම
කළ සේවය හරි අනගිය

♦ වින්දයා සිතාරා ප්‍රේමරත්න
නාලන්දා මැදිමහ විදුහල, මිනුවන්ගොඩ

BOC
ලංකා බැංකුව
BANK OF CEYLON
ඔබට විශ්වාස තැබිය හැකි බැංකුවයි
ලන්ඩන් ශාඛාව

වසර 57 කටත් වඩා කාලයක් පුරා ලන්ඩන් නගරයේ ඔබේ මුදල් අවශ්‍යතා සපුරාලමින් සේවය කරයි.

හෙට දවසේ සිහින සැබෑකරන
NRFC ගිණුමක් අරඹන්න !
උපයාගත් විදේශ මුදලට වැඩි වටිනාකමක් !

ලංකා බැංකුව අනේවාසික ගිණුම් හිමියන් සඳහා නොමිළයේ ජීවිත රක්ෂණ ව්‍යාපෘතියක් යළි හඳුන්වා දෙයි.

පවුම්, ඩොලර්, යූරෝ හෝ රුපියල් වලින් ඔබ ශ්‍රීලංකාවට මුදල් යවන විට අපේ සේවා භාවිතා කරන්න. එය ඉතා සුරක්ෂිතය, ලාභදායකය, කාර්යක්ෂමය.

ශ්‍රීලංකාව පුරා ලංකා බැංකු ශාඛා 301 කි. ඉන් 256 කම කටයුතු පරිගණක ජාලගතකර ඇත. ඕනෑම ශාඛාවකින් පවුලේ අයට හෝ නෑදෑ හිතවතුන්ට මුදල් යැවීමේ දී එය ගිණුම් වලට බැරකිරීමට හෝ ශාඛාවේදී මුදල් අතටම ලබාදීමට හෝ හැකි ය.

★ ආකර්ෂණීය විනිමය අනුපාතිකය.
★ ඕනෑම වානිජ හෝ ඉතිරිකිරීමේ බැංකුවකට යැවිය හැක.

ඔබගේම චෙක්පත් කළමනාකරු, ලංකා බැංකුව, ලන්ඩන් යනුවෙන් ලියා, ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, බැංකුවේ නම හා ශාඛාව දක්වා තැපැල් මගින් අපට යොමුකරන්න. (බ්‍රිතාන්‍ය මූල්‍ය රෙගුලාසිවලට යටත්ව)
වැඩි විස්තර සඳහා :

No 1, Devonshire Square, London EC2 M4WD
Phone : 020 7377 1888 Fax: 020 7377 5430
e-mail : bankofceylon.uk@btclick.com
Our Web - www.boc.lk
Nearest Railway Station - Liverpool Street ( tube & Rail ) Bishop Gate Exit

# ශ්‍රී ලංකාවේ දේශපාලන, කලා සහ නීති ක්ෂේත්‍රයේ අපූර්ව සිදුවීමක්



විජයදාස රාජපක්ෂ මහතා

**ශ්‍රී** ලංකාවේ දේශපාලන, කලා සහ නීති ක්ෂේත්‍රයේ අපූර්ව සිදුවීමක් වීය. පූර්වයේ නොවූ දේ අපූර්ව නම් වේ. එසේම දේශපාලනඥයෙකු, ජනාධිපති නීතීඥයෙකු විසින් එක්වර නීති ග්‍රන්ථ 5 ක් ද, **හිරු සඳු අරණ** නමින් තම ගීත රචනා 18 ක් අඩංගු සංයුක්ත තැටියක් ද, **සුදු පාවාඩ** නමින් නවකථා පොතක් ද, **සංහිඳ පාමුල** නමින් පද්‍ය ග්‍රන්ථයක් ද, **Beyond the Horizon** නමින් ඉංග්‍රීසී කාව්‍යයක්ද, **අග්නි දේශ** නමින් තමන් විසින්ම තිර රචනා කොට අධ්‍යක්ෂණය කළ කෙටි චිත්‍රපටයක් ද එකම දිනක එළි දක්වනු ලැබීමේ උත්සව යක් පැවැත්වීම මෙම අපූර්ව සිදුවීම ය.

මෙම සියල්ලෙහි නිර්මාතෘ අන් කිසිවකු නොව පසුගියදා මහත් ආන්දෝලනයට ලක් වූ පාර්ලිමේන්තුවේ කෝප් කමිටු වාර්තාව ගෙනා එහි සභාපති, ආණ්ඩු පක්ෂයෙන් විපක්ෂයට ගොස් අසුන්ගත් පාර්ලිමේන්තු මන්ත්‍රී, සහ ජනාධිපති නීතීඥ විජයදාස රාජපක්ෂ මහතා ය.

මේ සම්බන්ධයෙන් සිය නිවසේ පැවැත්වූ සාකච්ඡාවකදී ඊට සහභාගී වූ ඩිලාන් පෙරේරා ඇමැති වරයා රාජපක්ෂ මහතාගෙන් විමසා සිටියේ "කෝප් කමිටුවේ සභාපති ලෙසත් ජනාධිපති නීතීඥයෙකු ලෙසත් සිටිමින් ඔබට මේවා කරන්නට වෙලාව තිබෙන්නේ කොහේද? අපට අප ගැන ලජ්ජාත් හිතෙනවා" යනුවෙනි. ඊට පිළිතුරු දෙමින් රාජපක්ෂ මහතා කීවේ ලංකාවේ සරසවිවල උගන්වන මානව සම්පත් කළමණාකරන පාඨමාලාවත්, ව්‍යාපාර කළමණාකරණ පාඨමාලාවත් එක් කොට **කාලය කළමණාකරණය** යන නමින් අලුත් පාඨමාලාවක් සාදා ප්‍රගුණකරවිය යුතු බවයි.

දේශපාලනඥයින්ගේ ජීවිත කෙසේ විය යුතු දැයි අදහස් දක්වමින් රාජපක්ෂ මහතා මෙසේ කීවේ ය.

" මහජන ඡන්දයෙන් පත්වන කිසිදු දේශපාලනඥයෙකුට කිසිදු වරප්‍රසාද යක් නොදිය යුතුයි. අඩුම ගණනේ වැටුපක් හෝ නොගෙවිය යුතුයි. දේශපාලනයට නැතිනම් මහජන සේවයට එන පුද්ගලයා තමන්ට ස්වාධීන ආර්ථිකයක් සහිතව පැමිණිය යුතු අතර ඒ වෙනුවෙන් කිසිදු දෙයක් ඔහු නොලැබිය යුතුයි. "

රාජපක්ෂ මහතා මෙහිදී උදාහරණයට ගත්තේ ස්විට්සර්ලන්තයේ දේශපාලනඥයින් ය.

රුපියල් 1000 ක් පමණක් රැගෙන කොළඹට පැමිණි තමා දේශපාලනයට ආවේ එවැනි ස්වාධීන ආර්ථිකයක් සාදා ගැනීමෙන් අනතුරුව බව පැවසූ රාජපක්ෂ මහතා තමන්ට මන්ත්‍රීවරයෙකු ලෙස රුපියල් අසූතුන් දහස් ගණනක සියළු දීමනා සහිත වැටුපක් ලැබෙන බව ද, තමන් එය වෙනම ගිණුමක තැන්පත් කර ඇතැයි ද, ඉන් සත පහක් හෝ පුද්ගලිකව වියදම් කර නැතැයි ද, පැවැසූ ඔහු, එහි මේ වනවිට මිලියන 3 කට වැඩි මුදලක් එකතු වී ඇති අතර එය මහරගම පිළිකා රෝහලේ දැඩි සත්කාර ඒකකය නවීකරණය සඳහා යොදවා ඇති බවත් පැවසී ය.

මෙම අපූර්ව දේශපාලනඥයාගේ **හිරු සඳු අරණ** නම් මෙම උත්සවය ගිය සතියේ පෙබරවාරි 6 දින සවස බත්තරමුල්ල **The Waters Edge** හි දී අග්‍රාමාත්‍ය, කථානායක, විපක්ෂ නායක, ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු නිමල් ගාමිනී අමරතුංග, සහ පාර්ලිමේන්තු මන්ත්‍රී ආර්. සම්බන්ධන් යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලද්දේ ය.

( Sri Lanka E-News )

## වර්ෂපූර්ණ සිහිකිරීමයි!
## දුනිල් අල්මේදා මහතා



අප හිතාදර දුනිල්, ඔබ අපෙන් වියෝවී මේ මාසයට වසරක් සම්පූර්ණ වෙයි. ඒ වෙනුවෙන් ගිය සතියේ එනම්, පෙබරවාරි 8 වෙනි දින සුමධුර දම් දෙසුමක් ද, 9 වෙනි දින සංඝයා වහන්සේ විෂයෙහි දානමය පිංකමක් ද, ශ්‍රීලංකාවේත් ලන්ඩනයේත් සිදුකරන ලදී.

ඒ පින් බෙලෙන් සසර වසනා තුරු ඔබට අකල් මරණයක් නොවී අවසන නිවන් සාක්ෂාත් වේවායි පතන්නේ ලන්ඩනයේත් ශ්‍රීලංකාවේත් ඔබේ පවුලේ ඥාතීන් හා හිතමිත්‍රාදීන් සියළු දෙනායි.

## වර්ෂපූර්ණ සිහිකිරීමයි!



## සුරංගනී ඇල්ලෙපොල මිය

ඔබ අපගෙන් වියෝවී වසරක් පිරෙන මෙම පෙබරවාරි 22 සිකුරාදා සන්ධ්‍යාවේ ඔබ නිවසේ සුමධුර ධර්මදේශනාවක්ද, පසුදා 23 වන සෙනසුරාදා ඔබ වෙනුවෙන් සාංඝික දානයක්ද පිරිනැමේ. ඔබ අපෙන් වෙන්ව ගියත් ඔබ අප හදවතින් මොහොතකට හෝ වෙන්වූයේ නැත. නිතරම ආදරයෙන් සිහිපත් කරමු. මෙම පිංකමට සහභාගි වී ඔබට නිවන් සුව ප්‍රාර්ථනා කරන්නට එක්වන ලෙස ඔබේ ඥාති හිතවතුන් සැමගෙන් අපි ආදරයෙන් ඉල්ලා සිටිමු.

තිලක්, එමාල්, ශාමේන් අසිත ඇල්ලෙපොල.
16 Falconwood Avenue
Welling, Kent DA16

Srilanka Information Site ශ්‍රී ලංකා තොරතුරු අඩවිය
www.srilankans.com